# ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් පාලනය සිංහල භාෂාවෙන් තොරතුරු

AGRICULTURE VICTORIA

*ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් වික්ටෝරියා ප්‍රාන්තයේ බොහෝ පලතුරු හා එළවළු වගාවලට සෘජුවම හානි කරන කෘමි විශේෂයකි. ඔබේ ගෙවත්තේ සිටින ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් සොයා ගැනීමට සහ ඔවුන් ඔබ වගා කරන පලතුරු හා එළවළුවලට ඇති කරන හානිවලින් ආරක්ෂා කිරීමට මෙම කරුණු පත්‍රිකාව උපකාරී වේ.*

## ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් හඳුනාගන්නේ කෙසේද?

ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන්ගේ ජීවන චක්‍රයේ අදියර හතරක් ඇත. යෝග්‍ය පරිසර උෂ්ණත්වයක් හමුවේ බිත්තරයක් හොඳට වැඩුණු සුහුඹුල මැස්සෙකු බවට පත්වීමට ගත වෙන්නේ දින 30 ක කාලයකි (එනම් 26 ºC).



**1. බිත්තර:** ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් සත්කාරක පලතුරු සහ එළවළු තුළ සුදු, කෙසෙල් හැඩැති බිත්තර දමයි.

එක් ගැහැණු සතෙකුට දිනකට බිත්තර 100 ක් පමණ තැබිය හැකිය. බිත්තරයක් මි.මී. 1 දිගැති අතර සාමාන්‍ය ඇහැකට නොපැණෙන තරම් ඉතා කුඩාය.



**2. කීටයන්:** සෑම බිත්තරයකින්ම කුඩා ක්‍රීම් පැහැති කීටයන් එළියට එති. එම කීටයන් පලතුරු අනුභව කරන බැවින් පලතුරේ ඇතුළත කුණු වී යයි. මුළුමනින්ම වැඩුණු පසු කීටයෙකුගේ දිග මි.මී. 9 ක් වන අතර, පලතුරෙන් එළියට එන කීටයන් පිට වී පස තුළට යති.



**3. පිලා කෝෂ:** පස තුළට ගිය කීටයන් අණ්ඩාකාර, දුඹුරු, තද පිලා කෝෂ බවට පත් වේ. ඉන්පසු සෑම පිලා කෝෂයක් තුළම ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් වධර්නය වෙති.



**4. සුහුඹුලා:** ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන්ගේ දිග මි.මී. 7 ක් පමණ වන අතර රතු පැහැයට හුරු දුඹුරු පැහැයෙන් යුක්ත වන අතර ශරීරයේ කහ සලකුණක් ද ඇත.

වසන්ත, ගිම්හාන සහ සරත් සමයවලදී ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් ගෙවතුවල දක්නට ලැබේ.

## ගෙවතුවල වැඩෙන ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන්ගේ වාසස්ථාන

ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් විවිධ පළතුරු හා එළවළු තුළට බිත්තර දමති - මේවා ඔවුන්ගේ ‘වාසස්ථාන’ ලෙසත් හැඳින් වේ. කීටයන්ගේ වාසස්ථාන ලෙස බහුලව හැඳින්වන පළතුරු සහ එලවළු පහත දිස් වේ.



කීටයන්ගේ වාසස්ථාන ලෙස බහුලව හැඳින් වෙන පලතුරු සහ එළවළු ලැයිස්තුව මෙතැන: www.agriculture.vic.gov.au/qff

## ගෙවතුවල ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් පාලනය කිරීම

### 1. ගෙවතුවල ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් සිටින්නේ දැයි මුලින්ම පරීක්‍ෂා කිරීම

**උගුල්**: ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් ඔබේ ගෙවත්තේ සිටින්නේ දැයි සෝදිසි කරන්න. අසල ඇති සෙවන සහිත ගසක මීටර් 1.5 ක් පමණ උසකින් උගුල් අටවන්න. වසන්තයේ මුලදී මෙය ආරම්භ කර ශීත ඍතුව තෙක් ඉදිරියට ගෙන යන්න.

ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් ආකෂර්ණය කර ගැනීමට හා අල්ලා ගැනීමට විවිධ ක්‍රමවල උගුල් තිබේ. උගුල්වලින් ඇතැම්විට ඔබේ ගෙවත්තට හිතකර සතුන් පවා හසුවිය හැකි බැවින්, උගුල් ඇටවීමට පෙර ඒවා පිළිබඳව සොයා බලා, සුදුසු උගුල් පමණක් භාවිත කරන්න. ඔබේ ගස්වල හෝ ශාකවල කෘමිනාශක භාවිත කිරීමට පෙර ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන්ට සුදුසු ඒවාදැයි පරීක්‍ෂා කරන්න.

### 2. පාලන ක්‍රම

ඔබේ ගෙවත්තේ ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් ඔබ සොයා ගන්නේ නම්, පාලන ක්‍රමවල එකතුවක් භාවිත කිරීමෙන් ඔබට හොඳම වඩා ඉහළ ප්‍රතිඵල ලබාගත හැක. ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන්ට දෘඩ ලෙල්ලන් සහිත පලතුරු තුළද බිත්තර දැමිය හැකි බැවින් පලතුරු කැඩීමමට අවම වශයෙන් සති 6-8 කට පෙර පාලන ක්‍රම ආරම්භ කරන්න.

**බැහැර කිරීම වඩාත් සුදුසුය**: ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් පලතුරු හා එළවළු තුළ බිත්තර දැමීම වැළැක්වීම සඳහා පරාගනය කිරීමෙන් පසු පලතුරු ආවරණය කිරීම සඳහා කෘමි දැල්, බෑග් හෝ ආවරණ භාවිත කරන්න. දැලට පලතුර ස්පශර් කිරීමට ඉඩ නොදෙන්න.


කෘමි දැල්

**ඇම, උගුල් සහ කෘමිනාශක:** ඔබේ ගෙවත්තේ ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් පලතුරු සහ එලවළුවලට හානි කිරීමට පෙර ඇමක් දමන්න, නැතිනම් උගුලක් හටවන්න. ගැහැණු හා පිරිමි යන මැස්සන් දෙවගර්යම පාලනය කරන්න. උගුල්වලින් පමණක් මෙම පලතුරු මැස්සන් විශේෂය පාලනය කළ නොහැක.

ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් මරා දමන කෘමිනාශක ද ඇත. කෘමිනාශක වැරදි ලෙස භාවිත කරන්නේ නම් එය ඔබට ද හානිකර විය හැකිය - ලේබල්වල සඳහන් උපදෙස් හොඳින් කියවා අනුගමනය කරන්න.

මෙම නිෂ්පාදන සියල්ලම තවාන්, ගෙවතු වෙළඳසැල් සහ මාගර්ගත සිල්ලර වෙළෙන්දන්ගෙන් ද මිලදී ගත හැකිය.

### 3. ඔබේ පලතුරු සහ එළවළු පරීක්‍ෂා කරන්න

සිදුරු කරමින් කීටයන් පලතුරු සහ එළවළු ඇතුළත ගිය ඇත්නම්, එම පළතුරු සහ එළවළු මතුපිට සලකුණු දැකිය හැක.


පළතුරු සලකුණු

### 4. ගෙවත්තට අත්‍යවශ්‍ය රැකවරණය (හොඳ සනීපාරක්‍ෂාවක්)

ඉදවීමට පසු පලතුරු පරිභෝජනය කරන්න. දිරාපත් වූ, බිමට වැටී ඇති පලතුරු සහ එළවළු ඉවත් කරන්න. ඔබ අනුභව කිරීමට අවශ්‍ය නැති පලතුරු ද ඉවත් කරන්න. මෙය ක්වීන්ස්ලන්තු පළතුරු මැස්සන් ඔබේ ගෙවත්තේ බෝවීම වළක්වයි.

පළතුරු ගස් කප්පාදු කිරීම තුලින් ඔබට පලතුරු තෝරා ගැනීමට, කෘමි දැලක් හෝ කෘමි නාෂක භාවිත කිරීමට පහසු වේ.

පලතුරු ඉවතට විසි කිරීමට පෙර, ශීතකරණයේ තැබීම, මයික්‍රෝවේව් කිරීම, තාපාංක කිරීම හෝ සූයර්කරණය කිරීම මගින් ඇතුළත ඇති සියලු කීටයන් විනාශ කළ හැක (ප්ලාස්ටික් බෑගයක් තුළ පලතුරු මුද්‍රා තබා අවම වශයෙන් දින 14 ක් හිරු එළියේ තබන්න). ඔබ මෙය කළ පසු, බෑග් කළ පළතුරු ඔබේ කුණු බඳුනට දැමිය හැකිය.

ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන්ගෙන් ආසාදිත හෝ හානි වූ පලතුරු සහ එළවළු **පසේ තබා දිරාපත් වීමට ඉඩ නොදෙන්න.**

ඔබේ පලතුරු හා එළවළු ගස් රැකබලා ගැනීමට ඔබට නොහැකි නම්, ඒවා මෙම මැස්සන්ගේ බලපෑම් නැති, විසිතුරු පැලෑටි (උදා: ස්වදේශික වොට්ල්ස් හෝ ග්‍රෙවිල්වාස්) වෙත මාරු කරන්න.

## ක්වීන්ස්ලන්ත පලතුරු මැස්සන් පැතිරීමට ඉඩ නොදෙන්න

ක්වීන්ස්ලන්ත පළතුරු මැස්සන් නව ස්ථාන කරා පැතිරීම වැළැක්විය හැකි හොඳම ක්‍රමය ඔවුන් හානි කළ පලතුරු හෝ එළවළු ප්‍රවාහනය නොකිරීමයි.

එවන් හානිදායක පලතුරු සහ එළවළු ඔබ ප්‍රවාහනය කරන්නේ නම් ඔබෙන් ඇතැම් ප්‍රදේශවල දඩ මුදල් නිකුත් කෙරේ – වැඩි විස්තර සඳහා පිවිසෙන්න www.interstatequarantine.org.au.

වැඩි විස්තර www.agriculture.vic.gov.au/qff වෙබ් අඩවියෙන් හෝ 136 186 අංකයෙන් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය අමතා ලබාගන්න.

න්ත හා කලාප, 1 ස්ප්‍රිං වීදිය, මෙල්බනර්, 2020 මාතර්‍ මසට අනුව සහතික කර නිකුත් කෙරේ.වික්ටෝරියානු රැකියා දෙපාතර්මේන්තුව, ප්‍රා

© වික්ටෝරියා ප්‍රාන්තයේ රැකියා, ප්‍රාන්ත සහ කලාප 2020